(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක 1(18).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2024 අගෝස්තු 23 සිකුරාදා**

---

**2024 සැප්තැම්බර් 03 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 1),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 44 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව විමසා කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/66 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත යටතේ නියෝග (අංක 2),— 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 45 වගන්තිය සමඟ කියවිය යුතු 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විමසා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟත්වය ඇතිව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට සිදු කරගෙන යන අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන්, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 26 දිනැති අංක 2394/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2024 ජූලි 18 දිනැති අංක 2393/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝග,— 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනතේ 11 වගන්තිය සමඟ කියවිය යුතු 17 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2024 අප්‍රේල් 30 දිනැති අංක 2382/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2024.08.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

**2024 සැප්තැම්බර් 04 බදාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

රාජ්‍ය වත්කම් කළමනාකරණ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.*

---

## වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2024 සැප්තැම්බර් 04 බදාදා)**

2160/2024

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර අධ්‍යාපන කලාපයේ දෙමළ මාධ්‍ය පාසල් අතරින් 1 සී වර්ගීකරණය යටතේ වර්ගකර ඇති පාසල්වල නම් කවරේද;

(ii) ඉහත පාසල් අතරින් විදුහල්පතිවරුන් සහ උප විදුහල්පතිවරුන් නොමැති පාසල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිවරුන් බඳවා ගැනීම සඳහා පැවති විභාගයෙන් සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ට පත්වීම් ලබා දීමේදී, කළුතර අධ්‍යාපන කලාපයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් කිහිපයකට උප විදුහල්පති පත්වීම් එකකට වඩා ලබා දී ඇති බවත්;

(ii) උප විදුහල්පතිවරයකු නොමැති මග්ගොන, අල් හසනියා මහා විද්‍යාලයට මේ දක්වා උප විදුහල්පතිවරයකු පත් කර නොමැති බවත්;

(iii) ඉහත පාසලේ ගණිතය, ඉංග්‍රීසි, සෞඛ්‍ය, ඉතිහාසය, තොරතුරු තාක්ෂණවේදය යන විෂයයන් සඳහා ගුරු පුරප්පාඩු සහ ප්‍රාථමික ගුරු පුරප්පාඩු පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත විද්‍යාලයේ පවතින උප විදුහල්පති පුරප්පාඩුව සහ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 සැප්තැම්බර් 18 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

635/2024

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2023 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සිදු කර ඇති මනුෂ්‍ය ඝාතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් නඩු පවරා ඇති සැකකරුවන් සංඛ්‍යාව කොපමණ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2023 වර්ෂය තුළ අත්අඩංගුවට ගෙන ඇති මත් ද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එම මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ශ්‍රී ලංකා පොලිසිය විසින් ක්‍රියාත්මක කර ඇති යුක්තිය වැඩසටහනේ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1095/2024

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති මිනිරන් පතල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ වාර්ෂිකව නිෂ්පාදනය කරනු ලබන මිනිරන් ප්‍රමාණය කොපමණද;

(iv) එම මිනිරන් අපනයනය කරනු ලබන රටවල් කවරේද;

(v) දේශීය නිෂ්පාදන සඳහා මිනිරන් භාවිත කරන්නේද;

(vi) එසේ නම්, එම නිෂ්පාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1126/2024

ගරු ඩී. වීරසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට බඳවා ගන්නා ලද පුද්ගලයන්ට හිමි වන විශ්‍රාම වැටුප, දායක විශ්‍රාම වැටුපක් බව දන්නේද;

(ii) රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත, හිමිවන විශ්‍රාම වැටුප සම්බන්ධයෙන් තීරණය කරන බව පත්වීම් ලිපියේ සඳහන් කර තිබේද;

(iii) එසේ නම්, ඉදිරියේදී මෙම රාජ්‍ය සේවකයන්ට විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1156/2024

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා පමණක් අවසර ලබා දී ඇති වාහනවල මගීන් ප්‍රවාහනය කළ හැකිද;

(ii) එම වාහනවලින් මගීන් ප්‍රවාහනය කරනු ලබන බව දන්නේද;

(iii) එම වාහනවල මගීන් ප්‍රවාහනය කිරීම සඳහා ලබා දී ඇති නෛතික බලය කවරේද;

(iv) අනාරක්ෂිත ලෙස මගීන් ප්‍රවාහනය කරනු ලබන වාහන අනතුරුවලට ලක් වීම හේතුවෙන් මිය යන පුද්ගලයන් සංඛ්‍යාව ඉහළ ගොස් ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1246/2024

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2019 වසරේ ශ්‍රී ලංකාවේ පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් 'චැනල් 4' නාලිකාව විසින් එල්ල කරන ලද චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ ප්‍රගතිය;

(ii) ඉහත කොමිෂන් සභා වාර්තාව මෙම සභාවට සහ මහජනතාවට ලබා දෙනු ලබන දිනය;

(iii) එම විමර්ශනයේ ප්‍රගතියක් නොමැති නම් ඊට හේතු;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රහාර සම්බන්ධයෙන් 'චැනල් 4' නාලිකාව විසින් එල්ල කරන ලද එම චෝදනා විමර්ශනය කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීමට හේතු;

(ii) ඉහත කාරක සභාවේ ප්‍රගතිය;

(iii) ප්‍රගතියක් නොමැති නම්, ඊට හේතු;

(iv) ඉහත කමිටුවේ පරාමිතීන්;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එකී ප්‍රහාර සම්බන්ධයෙන් ස්වාධීන ජාත්‍යන්තර පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කරන ලද ඉල්ලීම් රජය දිගින් දිගටම නොසලකා හැර තිබීමට හේතු කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1251/2024

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාස්කු ඉරු දින ප්‍රහාරය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තාවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් කර ඇති නිරීක්ෂණ හා නිර්දේශ කවරේද;

(ii) ඔහු පොලිස් පරිපාලන අංශ ප්‍රධානි තනතුරට පත් කරන ලද දිනය, එම තනතුර සඳහා ඔහු නිර්දේශ කරන ලද දිනය සහ එම තනතුරට ඔහු නිර්දේශ කරන ලද පුද්ගලයන්ගේ හා ආයතනවල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති ඉහත නිලධාරියා එම තනතුරට පත් කිරීම සඳහා බලපෑ සාධක කවරේද;

(iv) ඉහත පත් කිරීම, නැවත සලකා බැලීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1287/2024

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 'ශ්‍රම වාසනා අරමුදල' ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා එම අරමුදල මඟින් ප්‍රතිලාභ ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම අරමුදලට මුදල් ලැබෙන මාර්ග කවරේද;

(v) එම අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1705/2024

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශාල ලෙස ඉහළ ගොස් ඇති කෘෂි බීජ වර්ගවල මිල නියාමනය කිරීමට වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(ii) කෘෂි බීජ ආනයනය කිරීමේදී කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන මැදිහත්වීම කවරේද;

(iii) ආනයනය කරනු ලබන කෘෂි බීජවල මිල පාලනය කිරීමට හා ඒවායේ ප්‍රමිතිය සහතික කිරීමට මැදිහත් වන්නේද;

(iv) එක් වර්ෂයක් තුළදී ආනයනය කරනු ලබන කෘෂි බීජ වර්ග, එම එක් එක් වර්ගයෙන් ආනයනය කරනු ලබන ප්‍රමාණය සහ ඒ සඳහා වැය කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1731/2024

ගරු ජගත් ප්‍රියංකර මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව බන්ධනාගාරයේ පවතින අධික තදබදයට විසඳුමක් ලෙස එම බන්ධනාගාරය වෙන්නප්පුව ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ බව දන්නේද;

(ii) ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා මූලික වියදමක් දරා තිබේ නම්, එම මුදල කොපමණද;

(iii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2005/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024.01.31 දින වනවිට රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, එක් එක් ඖෂධ සැපයුම්කරු අනුව;

(ii) ඉන්දියානු රජයේ ණය ආධාර මත ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ඖෂධ වෙනුවෙන් 2024.01.31 දින වනවිට ඉන්දීය ඖෂධ සැපයුම්කරුවන් සඳහා ගෙවීමට ඇති හිඟ මුදල, එක් එක් ඖෂධ සැපයුම්කරු අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2024 සැප්තැම්බර් 19 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1740/2024

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති රජයේ වී ගබඩා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටුවා ඇති ස්ථාන කවරේද;

(iii) ඉහත එක් එක් ගබඩාවේ ගබඩා කළ හැකි වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වර්ෂ 2015 සිට මේ දක්වා ඉහත ගබඩාවල ගබඩා කරන ලද වී ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් වී ගබඩා අතරින් මේ වනවිට භාවිතයට නොගන්නා වී ගබඩා තිබේද;

(ii) එසේ නම්, එම ගබඩා සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) එම ගබඩා නැවත භාවිතයට ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති වී ගබඩාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1754/2024

ගරු ඉෂාක් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තැලසීමියා රෝගීන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පුද්ගලික රෝහලකින් තැලසීමියා රෝගියකුට ජාන බද්ධ කිරීමේ ශල්‍යකර්මයක් සිදු කර ගැනීම සඳහා රුපියල් ලක්ෂ 48ක පමණ මුදලක් වැය වන බව දන්නේද;

(iii) එසේ නම්, ඉහත ශල්‍යකර්මය රජයේ රෝහල්වල සිදු කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1874/2024

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආයුර්වේද වෛද්‍ය උපාධිය (BAMS, BUMS, BSMS) හදාරන ලද 300කට ආසන්න පිරිසක් මේ වනවිට තම සීමාවාසික පුහුණුව නොමැතිව සිටින බව දන්නේද;

(ii) ඔවුන්ව සීමාවාසික පුහුණුව සඳහා යොමු නොකිරීමට හේතු කවරේද;

(iii) ඔවුන්ව සීමාවාසික පුහුණුව සඳහා යොමු කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1924/2024

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට පමණක් ආවේණික සහ වඳ වී යාමේ තර්ජනයට මුහුණ දී ඇති ඖෂධ පැළෑටි වර්ග හඳුනාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iii) ඒවා අතරින් රතු දත්ත පොතට ඇතුළත් වී ඇති ඖෂධ පැළෑටි වර්ග කවරේද;

(iv) එම ඖෂධ පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1947/2024

ගරු මිලාන් ජයතිලක මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා කාපට් අතුරන ලද මාර්ගවල දිග කිලෝමීටර් කොපමණද;

(ii) එම කිලෝමීටර් ප්‍රමාණය එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉදිරියේදී කාපට් ඇතිරීමට අපේක්ෂා කරනු ලබන මාර්ග කවරේද;

(iv) ඉහත (iii)හි සඳහන් මාර්ගවල දිග කිලෝමීටර් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1975/2024

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේ සිට මේ දක්වා ඉදිකර ඇති නාගරික නිවාස සංඛ්‍යාව;

(ii) ඒ අතරින් අඩු ආදායම්ලාභී නිවාස සංඛ්‍යාව සහ මධ්‍යම පාන්තික නිවාස සංඛ්‍යාව;

(iii) එම නිවාස අතරින් මේ වනවිට බෙදා දී ඇති අඩු ආදායම්ලාභී නිවාස සංඛ්‍යාව සහ මධ්‍යම පාන්තික නිවාස සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2011/2024

ගරු මයන්ත දිසානායක මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල පහසුකම් නොමැති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ග්‍රාම නිලධාරි වසමේ නම සහ පිරිසිදු පානීය ජලය නොමැති පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මහනුවර දිස්ත්‍රික්කයේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2024/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රට තුළ අවුල් සහගත තත්ත්වයන් නිර්මාණය කළ හැකි පුවත් පළ කරනු ලබන ව්‍යාජ මාධ්‍ය ගණනාවක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එසේ නම්, එම මාධ්‍ය කවරේද;

(iii) ලියාපදිංචි කර නොමැති ව්‍යාජ වෙබ් අඩවි තහනම් කිරීම සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2050/2024

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ආදාහනාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) 2023 වර්ෂයේ මැයි, ජුනි සහ ජූලි යන එක් එක් මාසයේ එම ආදාහනාගාර විසින් භාවිත කර ඇති ගෑස් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ආදාහනය කිරීම වෙනුවට විකල්ප ක්‍රම භාවිත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නේද;

(iv) එසේ නම්, එම විකල්ප ක්‍රම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2138/2024

ගරු තිස්ස අත්තනායක මහතා,— කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාබේරියතැන්න ග්‍රාම නිලධාරි වසමේ ඇති ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ඉඩමේ පදිංචි වී සිටින පවුල් 235ක්, මාබේරියතැන්න අභ්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා එම ඉඩමෙන් ඉවත් කිරීමට 2015.04.08 වැනි දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමතිය සහිතව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බවත්;

(ii) එම තීරණය ක්‍රියාවට නැංවීම මේ වනතෙක් ප්‍රමාද වීම හේතුවෙන් එම ඉඩමේ පදිංචිකරුවන් දැඩි දුෂ්කරතාවයකට පත් වී ඇති බවත්;

(iii) ඉදිකිරීම් කටයුතු හේතුවෙන් නිවාස කිහිපයකට අලාභහානි සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) මෙම ගුවන් තොටුපළ ඉදිකිරීම හේතුවෙන් නිවාස අහිමි වන පුද්ගලයන් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි විකල්ප ඉඩම් කඩිනමින් ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2024 සැප්තැම්බර් 20 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

6/2024

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් අතරින් ඉදිකිරීම් කටයුතු හා සංවර්ධන කටයුතු සඳහා මේ වනවිට භාවිත කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම දෙපාර්තමේන්තුව සතු ඉඩම්, බදු පදනම මත පෞද්ගලික අංශයට ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් ලබා දී ඇති සමාගම්/ආයතන කවරේද;

(v) ඉඩම් බදු දීම මගින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

45/2024

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විශේෂ ආරක්ෂක දිසාව යටතේ පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයට අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරින් දවස පුරා ප්‍රභූ ආරක්ෂක රාජකාරියේ නිරත වන බවත්;

(ii) එසේ වුවද, ජනාධිපති, අගමැති හා ඇමති ආරක්ෂක කොට්ඨාසයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට ලබා දෙන ඇතැම් වරප්‍රසාද හා දීමනා පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයට අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරින්ට ලබා නොදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට ලබා දෙන වරප්‍රසාද හා දීමනා කවරේද;

(ii) අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට ලබා දෙන වරප්‍රසාද හා දීමනා එක් එක් ප්‍රභූ ආරක්ෂක සේවාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පාර්ලිමේන්තු පොලිස් කොට්ඨාසයේ සේවය කරනු ලබන පොලිස් නිලධාරින්ට මේ වනවිට ලබා නොදෙන වරප්‍රසාද හා දීමනා ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

312/2024

ගරු හේෂා විතානගේ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා මේ වනවිට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වැය කරනු ලබන මුදල කොපමණද;

(ii) සූර්ය බල විදුලිය ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(iii) සූර්ය බලයෙන් විදුලිය නිෂ්පාදනය කිරීම ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(v) නොඑසේ නම්, එවැනි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2061/2024

ගරු වේලු කුමාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ —

(i) රජයේ දෙමළ මාධ්‍ය පාසල් අතරින් අ.පො.ස. (උසස් පෙළ) සඳහා විද්‍යා සහ ගණිත විෂය ධාරා හැදෑරීමට පහසුකම් සහිත පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල විද්‍යා සහ ගණිත විෂය ධාරා උගන්වනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අ.පො.ස. (උසස් පෙළ) සඳහා විද්‍යා සහ ගණිත විෂය ධාරා හැදෑරීමට පහසුකම් සහිත වතු පාසල් සංඛ්‍යාව සහ එම පාසල්වල විද්‍යා සහ ගණිත විෂය ධාරා උගන්වනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වතු පාසල්වල අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා සහ ගණිත විෂය ධාරාවන් සඳහා පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2088/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුම්රිය ආරක්ෂක සේවය සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවයේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) දුම්රිය මගීන්ගේ හා දුම්රිය දේපලවල ආරක්ෂාව සම්බන්ධයෙන් ඉතා වැදගත් සේවාවක් ඉටු කරනු ලබන එම සේවය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2105/2024

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "එක්ස්ප්‍රස් පර්ල්" නෞකා අනතුරට අදාළව වන්දි අයකර ගැනීම සම්බන්ධයෙන් කරුණු සොයා බැලීම සඳහා විද්වත් කමිටුවක් පත් කරන ලද දිනය කවරේද;

(ii) එම කමිටුවේ සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සාමාජිකයාගේ නම, තනතුර, ලිපිනය හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම කමිටුවේ රැස්වීම් පවත්වන ලද දින සංඛ්‍යාව හා එම දින වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ඉහත කමිටුව අක්‍රිය වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා බලපා ඇති හේතු කවරේද;

(iii) ඉහත කමිටුව අක්‍රිය වී ඇති තත්ත්වය තුළ "එක්ස්ප්‍රස් පර්ල්" නෞකා අනතුරට අදාළව වන්දි අයකර ගැනීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2149/2024

ගරු රිසාඩ් බදියුදීන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ හැර රජයේ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා 2018.08.31 දිනැති ගැසට් නිවේදනයක් මඟින් අයදුම්පත් කැඳවන ලද අතර, ඒ සම්බන්ධයෙන් විවෘත තරග විභාගයක් 2019 වසරේ පවත්වන ලද බවත්;

(ii) වසර 05ක පමණ දීර්ඝ කාලයකට පසු ඉහත විභාගයේ ප්‍රතිඵල නිකුත් කර ඇති බවත්;

(iii) කෙසේ වෙතත්, සම්මුඛ පරීක්ෂණයේ අවසන් ප්‍රතිඵල මෙතෙක් ප්‍රකාශයට පත් කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පුරප්පාඩු මේ වනවිටත් පුරවා තිබේද;

(ii) එසේ නම්, ඉහත පුරප්පාඩු පුරවන ලද පදනම කවරේද;

(iii) ඉහත සඳහන් විභාගය සමත් වූවන්ගේ වත්මන් තත්ත්වය කවරේද;

(iv) අවසන් සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමේ වත්මන් ප්‍රගතිය කවරේද;

(v) ඉහත පුරප්පාඩු තවමත් පුරවා නොමැති නම්, එම පුරප්පාඩු පිරවීමට නියමිත දිනය කවරේද;

(vi) ඉහත පුරප්පාඩු පුරවනු ලබන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2151/2024

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ හෙද විදුහල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) එම හෙද විදුහල් විසින් පවත්වනු ලබන එක් එක් පුහුණු පාඨමාලාවේ අන්තර්ගතය සහ පුහුණු කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) හෙද පුහුණුව අවසන් කරනු ලබන අභ්‍යාසලාභීන්ට ලබා දෙන සහතික කවරේද;

(iv) වාර්ෂිකව පුහුණුව අවසන් කරනු ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව එක් එක් හෙද විදුහල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ හෙද විදුහල් මඟින් හෙද පුහුණුව ලැබූ අභ්‍යාසලාභීන් අනිවාර්යයෙන්ම රජයේ රෝහල්වල සේවය කළ යුතු වන්නේද;

(ii) නොඑසේ නම්, පෞද්ගලික හෝ විදේශීය රෝහල්වල සේවය කිරීමට අවසර තිබේද;

(iii) ඔවුන්ට රජයේ රෝහල්වලට පත්වීම් ලබා දීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) රජයේ රෝහල්වල හෙද තනතුරේ වර්ෂයකට ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම සංඛ්‍යාව පිරවීම සඳහා රජයේ හෙද විදුහල්වල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේද;

(vi) නොඑසේ නම්, එම පුරප්පාඩු පිරවීමට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2165/2024

ගරු රවුෆ් හකීම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොවිඩ් - 19 වෛරසය ආසාදනය වීම හේතුවෙන් මිය ගිය පුද්ගලයන්ගේ මළ සිරුරු ආදාහනය කළ යුතු බවට රජය විසින් ගනු ලැබූ තීරණය මත ආදාහනය කරන ලද මළ සිරුරු සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ මිය ගිය එක් එක් පුද්ගලයාගේ නම, ස්ත්‍රී/පුරුෂ සමාජ භාවය, ජාතිය, ආගම, සමීපතම ඥාතියාගේ නම, ලිපිනය, මළ සිරුර ආදාහනය කරන ලද දිනය හා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් මිය ගිය එක් එක් පුද්ගලයාගේ මරණ සහතිකයේ අංකය, මරණය ලියාපදිංචි කරන ලද දිනය හා දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2166/2024

ගරු වන්දිම වීරක්කොඩි මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එම්.කේ. රංගන සුජීව යන අය සී/ස අධ්‍යාපන සේවකයින්ගේ සමූපකාර සකසුරුවම් හා ණය දෙන සමිතියේ පාලක මණ්ඩලයට පත් කරනු ලැබූ දිනය කවරේද;

(ii) ඒ අවස්ථාව වනවිට ඔහු දරමින් සිටි තනතුරේ සේවය කරමින් සිටියේද;

(iii) ඔහු මූල්‍ය වංචාවකට සම්බන්ධ වී සිටියේද;

(iv) ඔහුව ඉහත සමිතියේ පාලක මණ්ඩලය සඳහා නිර්දේශ කරන ලද්දේ කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමිතියේ පාලක මණ්ඩලයට ඔහුව පත් කරන ලද අවස්ථාව වනවිට ඔහුගේ වැටුපෙන් සාමාජික මුදල් අය කර තිබුණේද;

(ii) නොඑසේ නම්, සාමාජික මුදල් අය නොකිරීම සඳහා බලපාන ලද හේතු කවරේද;

(iii) ඉහත සමිතියේ අතුරු ව්‍යවස්ථාවේ 5, 2 හා 6 වගන්ති අනුව සාමාජික මුදල් හා ණය වාරික 3ක් හෝ ඊට වැඩි ගණනක් ගෙවීම පැහැර හැර ඇති අයෙකු පාලක මණ්ඩලයට පත් කළ හැකිද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?